ශ්‍රී. බු. ව. 2559 ක්වූ බිනර මස කලාපය, රා. ව. 2015 ක් වූ සැප්තැම්බර් මස 27 වන දින

මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# ටික ටික මොහොතින් මොහොත කෙලෙස් මල දුරු කරමු.

( ධමමපදය - මලවගගය ඇසුරිනි )

ගරු ස්වාමීන්වහන්ස,

පින්වත්නි

"අනුපුබෙබන මෙධාවී - ථොක ථොකං ඛණෙ ඛණෙ

කමමාරො රජතසෙසව - නිදධමෙ මල මතත නො"

"නුවණැත්තා ටික ටික මොහොතින් මොහොත පින් කරන්නේ රන් රිදීවල මල

ඉවත්කරන රන් කරුවෙකු මෙන් තමාගේ කෙලෙස් මල දුරුකරන්නේය ."

අද බිනර පුර පසළොස්වක පොහොය දිනයයි. ශාසන ඉතිහාසය තුළ කාන්තාවට විමුක්තිය ලබා ගැනීමට ලැබුනේ අද වගේ බිනර පෝය දිනයකයි. තථාගතයන් වහන්සේ තම ඥාතීන් විසින් පූජා කළ නිග්‍රෝධාරාමයේ වැඩවාසය කරන කල්හි මහා ප්‍රජාපතී ගෝතමිය වාර තුනක් පැමිණ බුදුන්වහන්සේගෙන් පැවිද්ද ඉල්ලූ නමුත් එම අදහස ප්‍රතික්ෂේප කළ සේක. බුදුන්වහන්සේ පස්වන වස් කාලය ගත කළේ විසාලා මහනුවර සමීපයෙහි වූ කූටාගාර ශාලාවේය. මහාප්‍රජාපතී ගෝතමී දේවිය තවත් කාන්තාවන් 500 සමග කහට පාට වස්ත්‍ර හැඳගෙන යොදුන් 51 මග ගෙවා පා ගමනින්ම අවුත් තමාගේ අවශ්‍යතාවය ආනන්ද හිමියන්ට සැලකලාය. එහිදී ආනන්ද හිමියන්ගේ ඉදිරිපත් වීම නිසා අෂ්ඨ ගරු ධර්ම පිළිගැනීමේ ප්‍රතිඵලයක් ලෙස මහාප්‍රජාපතී ගෝතමිය ඇතුළු 500 කාන්තාවන්ට බුදු සසුනේ පැවිද්ද ලැබුනේ අද වැනි බිනර පොහොය දිනයකයි. ගිහි ගෙදර ජීවත්වන යුක්ති ගරුක කාන්තාව දෙවඟනක් ලෙස දේශනා කළ බුදුන්වහන්සේ අද වැනි දිනක සිදුකළේ මෙහෙණියක් හැටියට කාන්තාව රහත් මෙහෙණියක් බවට පත්කිරීමයි. එවන් වැදගත් පොහොය දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ අප සිත්වල පවත්නා කෙලෙස් මල ඉවත් කර ගැනීමේ ක්‍රමය පැහැදිලි කර දීමටය.

අප මෙහි සඳහන් කළ ගාථා ධර්මය බුදුන්වහන්සේ දේශණා කළේ සැදැහැවත් බමුණෙක් නිමිති කර ගෙනය. එම නිදන කථාව මෙසේ දක්වමි.

එක් බමුණෙක් උදෑසනම නැගිට ගෙදරින් ගොස් භික්ෂූන් වහන්සේල පිඩුසිගා යාමට සිවුරු පොරවනු බලා සිටියේය. උන්වහන්සේලා සිවුරු පෙරවූයේ තණකොළ බහුලව වැඩී සිටි බිම් පෙදෙසක සිට ගෙනය. එහි එක් නමක් සිවුරු පොරවන විට සිවුරේ කොන තණකොළවල ගැටීමෙන් පින්නෙන් තෙමී ගියේය. ඒ දුටු බමුණා පසුද උදෑසන උදැල්ලක් ගෙන එතන තිබූ තණකොළ ටික ඉවත් කළහ. ඊට පසුද භික්ෂූන්වහන්සේලා එතන සිට සිවුරු පොරවන විට සිවුරු නොතෙමුණ අතර සමහර භික්ෂූන් වහන්සේලාගේ සිවුරුවල බිම තිබූ මඩ ගෑවිනි. ඒ දුටු බමුණා එතන තිබූ මඩ සහිත පස් ඉවත්කොට වැලි අතුරා පිරිසිදු කළහ. දැන් සිවුරු පින්නෙන් නොතෙමෙයි. මඩ නොතැවරෙයි. තව දිනක් එතන සිවුරු පොරවන

භික්ෂූන් වහන්සේලා තද අව්වේ සිටගෙන දහඩිය වගුරුවමින් සිටින විට එතන පන්සල් ගෙයක් කරවීය. මෙම පන්සල් ගෙය පූජාකිරීමට කළ උත්සවයට බුදුන්වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහ්න්සේලා වැඩම කරවීය. එහිදී ඉහත කී සැදැහැවත් බමුණා මුලසිටම තමා කළ කටයුතු ගැන බුදුන්වහන්සේට සැල කළහ. එහිදී බුදුන්වහන්සේ මේ බමුණාගේ ක්‍රියා කලාපය අගය කිරීම සඳහා ඉහත ගාථාව දේශණා කළ සේක. දේශණාව අවසානයෙහි මේ සැදැහැවත් බමුණා සෝවාන් විය.

මෙම ගාථාවෙන් ප්‍රදර්ශනය කෙරෙන්නේ මේ බමුණා තම සිතේ තිබූ ලෝභය - දෙවශය - මෝහය යන මිනිස් සිත වසා සිටින කෙළෙස් මල ක්‍රමානුකූලව ඉවත් කළ ආකාරයයි. තණකොළ ටික ඉවත් කිරීමට මුදලක් වියදම් නොවේ. නමුත් ඔහුගේ වටිනා ශ්‍රමය ඒ සඳහා වියදම් විය. මඩ සහිත පස් ඉවත්කොට වැලි අතුරා පිරිසිදු කිරීමට කිසියම් මුදලක් වියදම්වන්නට ඇත. එතන පන්සල් ගෙයක් සාද උත්සවයක් කොට බුදුන්වහන්සේ ප්‍රධාන මහාසංඝරත්නයට දනයක් දීමට කොතරම් මුදලක් වියදම්වන්නට ඇත්ද ? මේ ක්‍රියාවලිය තුළ දැකිය හැක්කේ නුවණැති සැදැහැවත් බමුණා ක්‍රමානුකූලව ටික ටික තම කෙලෙස් මල නැති කළ අයුරුය.

බුදුරජාණන්වහන්සේ තම දේශණාවන් සාමාන්‍ය ජනතාවට තේරුම් කර දීම සඳහා යොදගත්තේ ඉතා සරළ උපමාය. ඉන්දියාවේ රන් රිදී කර්මාන්තය ඉතා සුලභය. නිතර පාගමනින් වැඩම කළ බුදුන්වහන්සේ රන් රිදී කරුවන්ගේ කර්මාන්ත දකින්නට ඇත. නූතනයේද සවර්ණාභරණ වෙළඳ සැල් ඉදිරියේ කුඩා මේසයක් මත වීදුරු කීපයක් තබාගෙන ඒවාට මාල, කරාබු ආදිය දමා ටික ටික පිරිසිදු කරනු දැකිය හැක. රෙද්දක් නම් සබන් ගා එක්වරක් හොඳට සේදීමෙන් පිරිසිදු කළ හැකිය. රන් රිදී එසේ කළ නොහැක. ඒවායේ මල ඉවත් කිරීමේදී ටික ටික (ථොක ථොකං) මොහොතක් මොහොතක් පාසා (ඛණෙ ඛණෙ) ඉවත් කළ යුතුයි. ඉහත කී බමුණා තම ලෝභය නැතිකළේ එකවරම නොවේ. ටික ටිකය. ගිහි පැවිදි අපිත් අපේ සිතේ තිබෙන ලෝභාදී මල ක්‍රමානුකූලව ඉවත් කළ යුතුයි.

බුදුන්වහන්සේ අපේ සිත ගැන කළ දේශනාවක් අංගුතතර නිකායේ පභසසර වර්ගයේ පළමු හා දෙවන සුත්‍රවල එයි. ''මහණෙනි, මේ සිත මුලදී ප්‍රභාස්වරය. නමුත් ආගන්තුක වශයෙන් පැමිණෙන ලෝභාදී මලවලින් කෙළෙසෙන්නේය. කරුණු අවබෝධ නැති පුද්ගලයාට මේ බව තේරුම් ගැනීමට  නොහැකිය. (පභසසර මිදං භිකඛවෙ චිතතං තඤච බො ආගනතුකෙහි උපකකිලෙසෙහි උපකකිලිටඨං තං අසසුතවා පුථුජජනො යථාභූතං නපපජානාති) නමුත් නුවණැති ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා තම මල සහිත සිත හඳුනාගෙන ඒ මල ටික ටික මොහොතින් මොහොත ඉවත් කරදමයි. මේ ගාථාව දේශනා කරන්නට හේතු වූ නුවණැති බමුණා සිදුකළේ එවැනි ක්‍රියාවකි. ගිහි පැවිදි අප විසින් ද එසේ ක්‍රියා කොට අප සිත තුළ පවත්නා කෙළෙස් මල ඉවත් කළ යුතුයි. එය එකවරම කළ නොහැක. ටික ටික කළ යුතුයි.

පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවක පිරිසක් කැණීමක් කරන විට පස්කුට්ටියක් පෙරලී ගියහ. මේ පස්කුට්ටිය බැලූ බැල්මට කළයක හැඩයක් ගත් නිසා ඔවුන් ටිකෙන් ටික එම පස් ඉවත් කළහ. හැබෑටම මේ කළයකි. වෙන කළවලට වඩා මෙය ඉතා බරය. ඔවුන් එම කළය වතුරෙන් පිරිසිදු කළහ. ඔවුන්ගේ සියුම් උපකරණ යොදා තව තවත් පිරිසිදු කළහ. දැන් මේ කළය දිලිසෙයි. මේ කුමන කළයක්ද, රත්‍රං කළයකි. පස් කුට්ටිය දිලිසෙන තත්වයට පත්කළේ එයට කිසිවක් එකතු කිරීමෙන් නොවේ. එහි තිබූ මල ඉවත් කිරීමෙනි. අපේ මේ සදහම් පණිවිඩයේ සඳහන්වන බමුණා තම සිත දිලිසෙන තත්වයට පත්කරගත්තේ ඉහත කී ආකාරයෙනි. අද පෝය දින සිල් සමාදන් වී ඇති දරුවනි. ඔබ කුඩා කාලයේදී ඕනෑම කෙනෙක් තමා වඩා ගැනීමට සූදානම් උනොත් ඔහුගේ අතට ගියහ. නමුත් දැන් කවුරුහරි එසේ කථා කළොත් ඊට කැමති නැත. ඊට හේතුව කුමක්ද කුඩා කාලයේ තිබූ ප්‍රභාස්වර සිත මේ වන විට ආගන්තුකව ආ කෙළෙස් මල වලින් වැසී තිබීමයි. එම කෙළෙස් මල ටික ටික මොහොතින් මොහොත ඉවත් කරගත හොත් අපේ සිතත් දිලිසෙන තත්තවයට පත්කර ගත හැකිය. එසේ දිලිසෙන සිත් ඇති දරුවන් තම දෙමාපියන්ට ඉතා කීකරුය. තම ගුරුවරුන්ගේ අවවාද අසා තම ඉගනීම් කටයුතු සාර්ථක කරගනී. කෙළෙස් මලවලින් පිරුනු සිත් ඇති දරුවන් තම දෙමාපියන්ට අකීකරුය. ගුරුවරුන්ගේ අවවාද නොපිළි ගනී. ඔවුන්ගේ සිත් කෙළෙස් මළ වලින් වැසී ඇත. ජීවිතවල දියුණුවක් නැත. විවිධ දෙවිවරු පසුපස ගමන්කරමින් ආයාචනා කරන්නේ එවැනි මල සහිත සිත් ඇති දරුවෝය. ඒ නිසා පින්වත් දරුදැරියනි එම ප්‍රාර්ථනා සහ ආයාචනා නවත්වා සිත පිරිසිදු කරගෙන දියුණුවීමට උත්සාහ කරමු.

බුදුරජානන් වහන්සේ මෙම සිත දූෂිත කරන මල පිළිබඳ අගනා ගාථාවක් සංයතත නිකායේදී විස්තර කරයි.

''ලෝභය - දෙවශය - මෝහය යන මෙම පාප චේතනා පුද්ගල සිතේ

ඇති උනොත් ඒවා නිසා ඔහු හිංසනයට පත්වේ. අරටුව නැති ගස්වල

ගෙඩි හටගත් විට ගස විනාශවන්නා සේ''

ලොභො දෙසොච මොහොච - පුරිසං පාපචෙතසං

හිංසනති අතත සමභූතා - තචසාරංච සමඑලනති. (පුරිස සූත්‍රය)

කෙසෙල් ගසේ අරටුව නැත. එල හටගත් පසු ගස කපා දමයි. ගොයම් ගසේ අරටුව නැත. එල හටගත් විට ගස කපාදමයි. උණගස බටගස ආදී තචසාර ගස්වල සවභාවය මෙයයි. මේ ගස්වල විනාශය සිදුවූයේ බාහිරින් පැමිණි කරදරයක් නිසා නොවෙයි. ගස තුළින්ම ඇති වූ එලය කරන කොටගෙනය මේ උපමාවෙන් පැහැදිලි කරන්නේ අප සිත තුළ හටගන්නා ලෝභ, දෙස, මෝහ, නැමති එල විසින් පුද්ගලයා නැමති ගස විනාශ කරන බවයි. ඒ බව හඳුනාගෙන අපේ සිත්වල බලපවත්වන සියලු කෙළෙස් මල ටික ටික නැතිකර ගනිමු.

ලෝභය යනු අකුසල මූලයයි. පරිත්‍යාගය එහි අනෙක් පැත්තයි. අප බෝසතාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්පලක්‍ෂයක් දන පාරමිතාව පිරූ බව අපි දනිමු. එහිදී බෝසතානන්වහන්සේ කළ නොහැකි අප්‍රමාණ පරිත්‍යාග කළහ. වෙස්සන්තර ආත්මභාවය ඊට හොඳම නිදසුනයි. රන් කඳක් වන් කීකරු දරුවන් වූ ජාලිය, ක්‍රිෂ්ණජිනා යන දරුවන් දෙදෙනා දුන්නේ ජූජක බමුණාටයි. එවැනි උදාර පරිත්‍යාගයක් කිරීම එකවර කළ නොහැකි. නමුත් ටික ටික

කළ පරිත්‍යාග නිසා තම සිත තුළ පැවති ලෝභය නැමති මලය දුරුවිය. ඒ නිසා ඕනෑම වටිනා දෙයක් දීමට හැකි විය.

දුප්පත් කෙනෙක් යමෙකුගෙන් සාරියක් ඉල්ලුවොත් තමා ළඟ තිබෙන සියළු සාරි එළියට ගෙන තමාට ඇඳීමට නොහැකිම සාරියක් දීම සමහරුන්ගේ සිරිතයි. සාරියක් නොදීම සිටින්නේ නැතුව එවැනි සාරියක් හෝ දීම ටිකක් හෝ ලෝභය තුරන්වීමට හේතු වෙයි. තමා දුන් සාරිය ඇඳගෙන සිටින කෙනා දුටුවිට ඇයට මෙසේ සිතෙන්නට පුලුවන. මීට වඩා හොඳ සාරි මා ලඟ ඇත. එයින් එකක් මැයට දිය යුතුයි. ඒ සාරිය ඇඳගෙන සිටින විට සාරිය දුන් කාන්තාවට සිතට සතුටක් දැනේ. ඒ ලෝභය ටිකක් නැති වීම නිසා ඇති වූ සතුටකි. ඊලඟට ඇය තමා පාවිච්චි නොකළ ඉතා හොඳ අලුත්ම සාරියක් ඇයට දීමට පෙළඹෙයි. එම වටිනා සාරිය ඇඳගෙන සිටින විට සාරිය දුන් තැනැත්තිය අපමණ සතුටක් භුක්තිවිඳී. ඒ ලෝභය නැතිවීමේ සතුටයි. ඒ නිසා නැතිබැරිකම හා අවශ්‍යතාවය හඳුනා ගෙන සුළු දෙයක් හෝ පරිත්‍යාග කිරීමෙන් අනාගතයෙහි මහදෙයක් වුවද පරිත්‍යාග කිරීමට හැකියාවක් ඇතිවේ. ආචාර්ය ශාන්ති දේව පාදයෝ බෝධිචර්යාවතාරය නැමති කෘතියෙහි බෝසතාණන් වහන්සේ හඳුන්වන තැන පරිත්‍යාගය බෝධිසත්ව චරිතාදර්ශයක් බව පෙන්වා දෙයි. ''ලෙඩක් ඇති කෙනෙකුට මම බෙහෙතක් වෙම්වා, නිදිමත ඇති කෙනෙකුට මම ඇඳක් වෙම්වා. එගොඩට යාමට කැමති කෙනෙකුට මම පාලමක් වෙම්වා'' මේ නිර්ලෝභී චේතනාවේ උතුම් ඵලයෝය.

විශාරද නන්ද මාලනී මහත්මිය කියන්නේ ''ඉදෙන්නට හැකිනම් බතක් වී බතක් නොඉදෙන පැලෙක රහසින් '' යනුවෙනි. මෙහි පැලක රහසින් යන වචනය තුළ සඳහන්වන්නේ නිර්ලෝභී චේතනාවයි. හැම දෙනාටම ප්‍රසිද්ධ කර සමහරු එවැනි දේ කරති. ඒ ලෝභය වැඩිකර ගැනීමට ගන්නා උත්සාහයෝය. එවැනි දේ තුළින් තව තවත් සිතේ මල බැඳේ. ඒ නිසා කිසිදු අපේක්ෂාවකින් තොරව දෙන දේ හොඳ දෙයක්ම දී අපේ සිත දිලිසෙන තත්වයට පත් කර ගනිමු.

සිත කිළිටිකරන ඊළඟ අකුසල මූලය දෙවශය හෙවත් තරහවයි. අපේ ඇස ආදී ඉදුරන්ට ලැබෙන රූපාදී අරමුණු අප්‍රසන්න උනොත් අපේ සිතේ තරහවක් ඇතිවේ. අපි සමාජය තුළ සතුටින් සිටින විට අපේ මුහුණ කොතරම් ලස්සනද? ඊට හේතුව තරහව අඩු අයගේ ශරීරය තුළ පවත්නා ලේ ධාතුව පිරිසිදු වීමයි. අපේ සිතට තරහවක් ආවොත් අපේ මුහුණ දුර්වර්ණ වන්නේ තරහවනිසා ලේ ධාතුව අපවිත්‍ර වීමෙනි. එවිට අපි විවිධ රෝග පීඩාවන්ට ලක්වෙමු. මේ තරහව නම්වූ ආඝාතය නැතිකර ගැනීමට බුදුන්වහන්සේ උපදෙස්දී තිබේ. ඒ උපදෙස්වල කිසිම තැනක තරහව ඇතිකරගැනීමට ඉඩක් දී නැත. ඊට හේතුව දෙවශය යනු සිත දූෂ්‍යකරන මලයක් බැවිනි. එය එකවරම නැතිකරගත නොහැක. ටික ටික කළ යුත්තකි. එවිට අපේ සිත දිලිසෙන තත්වයට පත්වේ.

සිත කිලිටි කරන ඊළඟ අකුසල මූලය මෝහය නම්වූ මුලාවයි. බුදුදහමේ පදනම වන්නේ අනිච්ච, දුක්ඛ, අනත්ත යන්නය. මේ තත්වය යමෙකු තුළ බලපවත්නේ නම් ඔහුගේ සිත පිරිසිදුය. නමුත් කරුණු වටහා ගැනීමට නොහැකි අය කියන්නේ ලෝකය නිත්‍යය, සුඛය ආත්මය කියායි. මේ හබය නිසා පුද්ගලයා තුළ ආත්ම දෘෂ්ටියක් හට ගනී. එය සියලුම ගැටලුවලට මුලය. කරුණු අවබෝධකර නොගත් අය සෙලවෙන ලෝකය තුළ නොසෙලවෙන යමක් තිබේ යයි සිතති. ඒ ආත්මවාදී චින්තනය නිසා පුද්ගලයා සිතන්නේ තමා සදාකාලිකවම ජීවත් වන බවයි. එවිට ඔහුට හොඳ නරක කුසල් අකුසල් පිළිබඳ අවබෝධයක් නැතිවෙයි. එම මෝහය නම් වූ මලය සිතින් ටික ටික ඈත් කළ යුතුයි. එවිට අපේ සිත ප්‍රභාස්වරවී දිලිසෙන තත්වයට පත් වේ.

අප මේ පසුකරමින් සිටින්නේ වස්කාලයයි. මේ කාලය තුළ ගිහි පැවිදි හැම දෙනාම වෙනදට වඩා සිත සකස් කරගැනීමට මුල් තැන දෙයි. වස්කාලය තුළ වස් දන්දෙන්නට කඨින පිංකම් කරන්නට හැමෝම කැමතිය. එය හොඳ ආකල්පයකි. නමුත් සමහර අය එම පිංකම් කරන්නේ ලෝභ, දෙවශ, මෝහ වැඩිවෙන ආකාරයටයි. එයින් සිදුවන්නේ සිත මලවලින් බැඳී නොදිලිසෙන තත්වයට පත් වීමයි. ඒ නිසා මේ වස්කාලය තුළ අප කරන සියළු පිංකම්  ඉහත කී ලෝභ, දෙස, මෝහ ටික ටික තුනී වීම සඳහා යොදගත යුතුයි. එවිට අපේ සිතේ තිබෙන කෙලෙස්මල ටික ටික නැතිවී අපේ සිත ප්‍රභාස්වර තත්වයට පත්වේ. එවිට ගැටුම් නැත. සහනදයීව දෙලොවම ජය ගත හැකිය.

තෙරුවන් සරණයි... !